

# රංගන උදුම්බරා නර්තන කණ්ඩායම ලෝක ක්‍රිකට් කුසලාන සමාරම්භක උළෙලේ රංගනයට



සිසිර දිසානායක

මෙවර අයිසීසී ක්‍රිකට් ලෝක කුසලාන ගරගාවලිය ආරම්භ කිරීමේ උළෙල පෙබරවාරි මස 21 වන දින මෙල්බන් නගරයේදීත් එදිනම නවසීලන්තයේ ක්‍රයිස්ට්චර්ච් නගරයේදීත් පැවැත්වීමට නියමිතය. තරගාවලියට සම්බන්ධවන ක්‍රිකට් කණ්ඩායම් දාහතරේ නායකයන් මෙම උළෙල සඳහා සහභාගි වනු ඇත . එම රටවල් දාහතරේ සංස්කෘතිකාංග ඇතුළත් සංදර්ශනය පෙබරවාරි 12 දින මෙල්බන් නගරයේ සිඩ්නි මයර් මියුසික් බෝල් හිදී සවස 7.30 සිට 8.30 දක්වා පැවැත්වීමටද කටයුතු සංවිධානය කර ඇත .



මෙම උළෙල සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට වරම් ලබන්නේ මෙල්බන් නුවර ප්‍රසිද්ධ නර්තන කණ්ඩායමක් වන රංගන උදුම්බරා නර්තන කණ්ඩායමයි. ඒ පිළිබඳව අදහස් දැනගැනීම සඳහා අපි රංගන හා උදුම්බරා ආචාර්යවරුන් දෙපළ ඇමතුවෙමු.

"අයිසීසිය හා වික්ටෝරියන් මයර් ඉවෙන්ට්ස් කොම්පැනි එකතු වෙලා සංවිධානය කරන මෙම දැවැන්ත උළෙල සඳහා අපේ නර්තන කණ්ඩායම තෝරාගැනීම පිළිබඳව අපි ඉතා නිහතමානීව ආඩම්බර වෙනවා." උදුම්බරා නර්තනාචාර්යවරිය සාකච්ඡාවට මුල පිරුවාය.

"අපේ කණ්ඩායම ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන ප්‍රජාව එක්ක එකතු වෙලා දැවැන්ත නිර්මාණ වලට සම්බන්ධවෙන්න වාසනාව ලබපු එකම නර්තන කණ්ඩායම කියලයි අපට හිතෙන්නෙ" රංගන නර්තනාචාර්යවරයාද ඊට එක්විය.

"ප්‍රධාන ප්‍රවාහය සමග සම්බන්ධවෙලා කටයුතු කරන එක බොහොම අසීරු වැඩක්. අපේ නර්තන කණ්ඩායම ශ්‍රී ලංකා නර්තන කණ්ඩායම අතරින් වෘත්තිය මට්ටමේ ප්‍රධාන පෙළේ නර්තන කණ්ඩායමක් ලෙස ඒ අය අතරේ තියෙන පිළිගැනීම නිසයි අපට මේ අවස්ථාව ලැබුණේ. කලින් කියපු ආයතන එක්ක සාකච්ඡා සම්මුඛ පරීක්ෂණ වගේ නොයෙක් අදියර වලට මුහුණ දීලා ඒවායේ ප්‍රතිඵලයක් විදියටයි මේ අවස්ථාව අපට ලැබුණේ" ඒ උදුම්බරා යි.

"පහුගිය අවුරුද්දෙ මල්ටිකල්චරල් ආට්ස් වික්ටෝරියා සංවිධානය කරපු "වි අයි වී ඒ" උත්සවය නියෝජනය කිරීමත් ඒ සංවිධානය ඉදිරිපත් කරපු වෙනත් උත්සව ගණනාවකට සම්බන්ධවෙන්න ලැබීමත් මතක් කරන්න ඕනෙ"



"2008 දී ඕස්ට්‍රේලියා ඩාන්ස් එවෝඩ් සෙරමනි එකේදි බහුජාතික නර්තන කණ්ඩායම් අතරින් හොඳ කණ්ඩායමක් විදියට අපව ඒ සංවිධායකයින් හඳුනා ගත්ත එක ප්‍රධාන ප්‍රජාව සංවිධානය කරන උත්තසව වලට අපව දායක කරගන්න එක හේතුවක්"

සිය නර්තන කණ්ඩායමට වසර 10 ක් පිරීම නිමිතිකොටගෙන මෙපුර ඉතිහාසයේ ප්‍රථම වතාවට අප දියණියන් දස දෙනෙකුගේ කලඑළි මංගල්‍යයක් 2014 දී පැවැත්වීමත් ඊට අමතරව සිඩ්නි කැන්බරා බ්‍රිස්බේන් ඩාවින් සහ නවසීලන්තයේ ප්‍රසංග පැවැත්වීමත් රංගන උදුම්බරා නර්තන කණ්ඩායම මෙතෙක් ආ ගමනේ තවත් වැදගත් අවස්ථා වෙයි.

ලොව කොහේ ජීවත් වුවද තම මව්බිම අමතක නොකොට එහි සංස්කෘතික උරුමයන් රැක ගනිමින් තමන් උගත් ශාස්ත්‍රය ක්‍රමාණුකූලව නිවැරදිව තමන් ජීවත් වන රට තුළ ප්‍රජාවට අවංකව බෙදා දීමෙන් තමන් මෙම ජයග්‍රහණ ලද බවත් එසේ කටයුතු කරන ඕනෑම අයෙකුට මේ සා ගමනක් යාම අසීරු නොවන බවත් රංගන උදුම්බරා නර්ථනාචාර්යවරුන් දෙපළ පිළිසඳර අවසන පැවසූහ. අපි ඔවුනට සුබ පැතුවෙමු.

